දුරකථන අං./தொலைபேசி இல./Telephone No.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 2784832, 2784807, 2785617
ලේකම් / செயலாளர் / Secretary — 2784812
කාර්යාලය / அலுவலகம் / Office — 2785141-50, Fax: 2784846
ඊමේල්/ஈ–மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education**
'ඉසුරුපාය' ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල.
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.
පාසල් කටයුතු ශාඛාව

ඔබේ අංකය / உமது இல. / Your No ……………………….

මගේ අංකය / எமது இல. / My No. — ED/01/12/09/03/02

දිනය / திகதி / Date — 2016.09. 22

**චක්‍රලේඛ අංක :21/2016**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම රජයේ හා රජයට අනුබද්ධ පාසල්වල විදුහල්පතිවරුන් වෙත

**පාසල් භූමියට පිවිසෙන දෙමව්පියන්ගේ ඇඳුම සම්බන්ධව.**

දෙමව්පියන් විසින් දරුවන් උදෑසන පාසල්වලට රැගෙන පැමිණීමේ දී හා වෙනත් විවිධ අවශ්‍යතා සඳහා පාසල්වලට පැමිණීමේ දී සැරසී පැමිණිය යුතු ඇඳුම පිළිබඳ ව පාසල් විසින් සීමාවන් පනවා තිබීම නිසා ඔවුන් මුහුණපාන අපහසුතාවන් පිළිබඳ ව මෙම අමාත්‍යාංශය වෙත කරුණු ඉදිරිපත් කරමින්, පාසල්වලට දෙමව්පියන් පැමිණීමේ දී ඔවුනට පහසු ඇඳුමකින් සැරසී පැමිණීමට අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලීම් කර ඇත.

එම ඉල්ලීම් සැලකිල්ලට ගෙන දරුවන්ගේ අවශ්‍යතා වෙනුවෙන් පාසල්වලට දෙමව්පියන් පැමිණීමේ දී, පාසලේ හා දෙමාපියන්ගේ ගරුත්වය රැකෙන පරිදි විධිමත්, විනීත ඇඳුමකින් සැරසී පාසලට පැමිණීමට හා අදාළ රැස්වීම්වලට සහභාගීවීමට අවස්ථාව සලසා දෙන ලෙස කාරුණිකව දන්වමි. එමෙන් ම, ඔවුන් විදුහලින් බැහැර නොකිරීමට සහ පාසලට පැමිණෙන දෙමාපියන්ගේ ඇඳුම සම්බන්ධයෙන් ඔවුන් අපහසුතාවයට පත් වන ආකාරයෙන් විද්‍යාලයේ දැන්වීම් පුවරුවල විවිධ දැන්වීම් පළ කිරීමෙන් වළකින ලෙස ද ඔබ පළාතට අයත් සියලු ම පාසල්වල විදුහල්පතිවරුන් දැනුම්වත් කරන ලෙස වැඩි දුරටත් මෙයින් දැනුම් දෙමි.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය